**හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම -2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ සංකල්පනාත්මක රාමුවට අනුව, මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන්නේ යම් ආයතනයකට අඛණ්ඩ පැවැත්මක් ඇති බවත් එය අවිනිශ්චිත අනාගත කාලයක් සඳහා ක්‍රියාත්මක වනු ඇති බවත් උපකල්පනය කරමිනි. කෙසේ වෙතත්, සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ හෝටල් ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇත. තවද, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන කැබිනට් තීරණය අනුව, කැන්විල් හෝල්ඩින් (පුද්) සමාගමේ (මව් සමාගම), කොටස් හිමිකාරිත්වයට සමානුපාතිකව, සමාගමේ කොටස් එහි කොටස් හිමියන්ට පැවරීමට උපදෙස් ලබා දී ඇත.<br>එබැවින්, ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයේ බලපෑම හේතුවෙන් සමාගමට  අඛණ්ඩ පැවැත්ම පදනම මත සිය මූල්‍ය ප්‍රකාශන සකස් කළ නොහැකි අතර, ජංගම හා ජංගම නොවන ලෙස වත්කම් හා බැරකම් ඉදිරිපත් කළ නොහැක. කෙසේ වෙතත් සමාගම 2021 දෙසැම්බර් 31 දිනට සිය මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ රුපියල් 164,736,110 ක ජංගම නොවන වත්කම් ඉදිරිපත් කර  තිබුණි | 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් සමාගමේ හිමිකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් තීරණය වාර්තා කරන ලද දිනට ක්‍රියාත්මක වී නොතිබිණි.<br><br>කෙසේ වෙතත්, සමාගමේ වත්මන් කළමනාකාරිත්වය ව්‍යාපෘතියේ සහ සමාගමේ ඉදිරි ගමන පිළිබඳව රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනිමින් පවතී. | කළමනාකාරිත්වය විසින් අදාළ අධිකාරියෙන් අවශ්‍ය උපදෙස් ලබාගෙන මෙම ගැටලුව විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ හයට් රිජන්සි හම්බන්තොට හෝටලය ඉදිකර සත්කාරක සේවා සැපයීමේ නිරත වීමයි. 2015 වර්ෂයේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමට සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කිරිම හේතුවෙන් හෝටල් ඉදි කිරීමේ ව්‍යාපෘති කටයුතු අවසන් වී ඇත. කෙසේ වෙතත් සමාගම ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් අපේක්ෂාවෙන් සිටී.
සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.  11,875,894 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු. 13,456,358 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි   රු. 1,580,464 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ස්ථාවර තැන්පතු ආපසු ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ආදායම රු. 1,572,592 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වසර පහ සඳහා ආදායම්, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය/ (අලාභය) විචලනයන් සහිත විශ්ලේෂණය සහ අඩු වැඩි වීමේ ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| **වර්ෂය** | **2021** | **2020** | **2019** | **2018** | **2017** |
|---|---|---|---|---|---|
| මුළු ආදායම රු. | 20,044,189 | 21,624,281 | 39,142,280 | 49,770,092 | 89,054,257 |
| ආදායම් වැඩිවීමේ/(අඩුවීමේ) ප්‍රතිශතය | -7% | -45% | -21% | -44% | -67% |
| පරිපාලන වියදම් රු. | 4,418,012 | 3,918,547 | 4,003,549 | 6,415,872 | 7,354,115 |
| පරිපාලන වියදම් වැඩිවීමේ/ (අඩුවීමේ) ප්‍රතිශතය | 13% | -2% | -38% | -13% | -61% |
| බදු පසු ශුද්ධ ලාභය/(අලාභය) | 11,875,894 | 13,456,358 | 25,299,887 | 31,848,469 | 63,498,793 |
| බදු පසු ශුද්ධ ලාභය/(අලාභය) වැඩිවීමේ/ (අඩුවීමේ) ප්‍රතිශතය | -12% | -47% | -21% | -50% | -72% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, පසුගිය වසර පහ සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| අනුපාත | **2021** | **2020** | **2019** | **2018** | **2017** |
|---|---|---|---|---|---|
| ශුද්ධ වත්කම්වල වැඩි වීම/ (අඩු වීම) | 1.75% | 2.02% | 3.95% | 4.03% | -85.52% |
| මූල්‍ය ආදායමේ වැඩි වීම/ (අඩු වීම) | -7.27% | -44.77% | 0.01% | -55.59% | 30.95% |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 2.26% | 1.98% | 3.79% | 4.97% | 13.26% |
| කොටසක ඉපයීම | 0.24 | 0.27 | 0.51 | 0.64 | 0.41 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මගපෙන්වීම් අනුව, සමාගම විසින් සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම වෙත රුපියල් මිලියන 400 ක කෙටි කාලීන ණයක් කිසිදු ලිඛිත ගිවිසුමකින් තොරව, 8.79% ක පොලී අනුපාතිකයක් යටතේ ලබා දී ඇත. (රුපියල් මිලියන 300 ක් 2018 ජනවාරි 12 දින ලබා දී ඇති අතර රුපියල් මිලියන 100 ක් 2018 ජනවාරි 18 වැනි දින ලබා දී ඇත.) සමාගම ලැබිය යුතු පොලිය රු. මිලියන 107.07 ක් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති අතර, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම විසින් මෙම මුදල් විගණිත දිනය දක්වා පියවා නොතිබුණි. | ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතිය අත්විඳිමින් සිටින මූල්‍ය බාධාවන් හේතුවෙන්, කිසිදු පියවීමක් සිදු වී නොමැත. හයට් හි ව්‍යාපෘති මූල්‍යන වැඩසටහනට අනුව, කළමනාකාරිත්වය වහාම බේරුම්කරණය අපේක්ෂා කරයි. | අන්තර් සමාගම් ගනුදෙනු සඳහා කළමනාකරණයට නිසි ප්‍රතිපත්තියක් තිබිය යුතුය |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම බදු පදනම මත හෙක්ටයාර 3.8 ක ඉඩමක් රුපියල් මිලියන 177.97ක් ආයෝජනය කර නාගරික සංවර්ධන අධිකාරියෙන් අත්පත් කර ගෙන ඇත. කෙසේ වෙතත් ඉඩම කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | ව්‍යාපෘතියේ සහ සමාගමේ ඉදිරි ගමන පිළිබඳව සමාගමේ වත්මන් කළමනාකාරීත්වය රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇත.<br>2022 සැප්තැම්බර් 1 දිනැති ලිපිය මගින්, හෙලෙන්කෝ සතු නාගරික සංවර්ධන අධිකාරියෙහි ඉඩම පිළිබඳ ලබා ගත් නීතිමය උපදෙස් 2ක් සම්බන්ධව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරය අපේෂාවෙන් සිටි. | මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ එවැනි අරමුණක් ක්‍රියාත්මක වන තෙක් වෙනත් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යෙදවීමට කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | නිරීක්ෂණයට එකඟ වන අතර සමාගමේ අනාගත දිශානතිය පිළිබඳ උපදෙස් සඳහා අප තවමත් බලා සිටින බැවින් දිශාව කුමක් වේද යන්න පිළිබඳව අපට පවා අවිනිශ්චිත බැවින් වාර්ෂික සැලැස්මක් හෝ කාර්ය සාධනය සඳහා ඉලක්කයක් සකස් කිරීමේ ක්‍රමයක් නොමැත.<br>ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සඳහා අප විසින් රේඛීය අමාත්‍යංශයෙන් උපදෙස් අපේක්ෂාවෙන් සිටි. තවද, 2022 සැප්තැම්බර් 1 දිනැති ලිපිය මගින්, හෙලෙන්කෝ සතු නාගරික සංවර්ධන අධිකාරියෙහි ඉඩම පිළිබඳ ලබා ගත් නීතිමය උපදෙස් 2ක් සම්බන්ධව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරය අපේෂාවෙන් සිටි. | සමාගම සිය වාර්ෂික කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 3.7.5 වගන්තියට අනුව, මෙහෙයුම් සත්‍ය සහ සාධාරණ ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා, පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කළමනාකරු වගකිව යුතුය. නමුත් ආයතනයේ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යභාරය, බිල්පත් ගෙවීම් සහ වවුචර සහතික කිරීම පිළිබඳ පූර්ව විගණනයක් සිදු කිරීම සඳහා සීමා කර ඇත. | 2015 වසරේ සිට කැන්විල් සමූහය අභ්‍යන්තර විගණන කාර්යය වරලත් ගණකාධිකාරී සමාගමකට පවරා ඇත. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම මත පදනම්ව, කාර්තුමය වාර්තා 2018 ජුනි 30 දක්වා විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.<br>ඔවුන් 2019, 2020 සහ 2021 වසර සඳහාද පත්කරන ලද නමුත්, ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම සහ පසුව ඇති වූ covid19 සීමා කිරීම් හේතුවෙන් අභ්‍යන්තර විගණනය සඳහා කැඳවීම් නොකරන ලදී .<br>අභ්‍යන්තර විගණන කළමනාකරු විසින් දැනට පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ යම් අඩුපාඩු පවතී නම් විගණන කමිටුවේ අවධානයට යොමු කර ඇත. තවද ඔහු විසින් කලින් ඉස්මතු කරන ලද ක්ෂේත්‍ර වල තත්වය සමාලෝචනය කර කාරක සභාවට වාර්තා කරයි | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස, අභ්‍යන්තර විගණනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය සහතික විය යුතුය. |